26-07-2019

De mezenod college - kandana De mezenod college - kandana De mezenod college - kandana

# ද මැසිනොද් විදුහල - කඳාන

# De mezenod college - kandana

21 B I

## 2019

11 ශ්‍රේණිය

## දෙවන වාර පරීක්ෂණය

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

කාලය පැය 1 යි

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අංක 1 - 2 ප්‍රශ්නවල අංකිත පදයේ අර්ථයට වඩාත් සමීප අර්ථය තෝරන්න.

01. අසනීපයෙන් පෙළුණු ඔහු කාගේවත් පිහිටක් නැති නිසා ඉබාගාතේ යන්නට විය.

i. නිදැල්ලේ
ii. ඉක්මනින්
iii. සෙමින්
iv. දෙපයින්

02. පළාත් සභා ක්‍රමය සුදු අලියෙකැයි සමහරු කියති.

i. මනාව සංවිධානය වූ
ii. මතුපිටින් පමණක් ඔපය ඇති
iii. නඩත්තුව මිස ආදායමක් නැති
iv. විශාල වියදමක් උපයන

- 03 සිට 04 ප්‍රශ්න වල නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරන්න.

03. ........................ වලින් තොර අහසේ සඳ දිප්තිමත්ව බැබළේ.

i. වළාකුළු
ii. වලාකුළු
iii. වලාකුලු
iv. වළාකුලු

04. අනුරාධපුරයේ ඇති පැරණි ........................ අපේ ශ්‍රේෂ්ඨ සභ්‍යත්වය මොනවට විදහා පායි.

i. නෂ්ටාවශේෂ ii. නෂ්ඨාවශේෂ iii. නෂ්ඨාවශේෂ iv. නෂ්ටාවශේෂ

05. අකාරාදී පිළිවෙළට යෙදී ඇති වරණය තෝරන්න.

i. කම්මල, ජයග්‍රහණය, චන්ද්‍රයා, සශ්‍රීක
ii. උත්තරය, ඒදණ්ඩ, ඉන්නල, ඖදාර්ය
iii. බ්‍රාහ්මණ, මිස්සක, පච්ච, ව්‍යාකූල, ළපටි
iv. ඡන්දය, වකය, පවන්පත, තණබිම

06. වැරදි ව්‍යාකරණ විග්‍රහය ඇතුළත් වාක්‍ය තෝරන්න.

i. සංශයාර්ථයක් ප්‍රකාශ වන විට අන්තර් වාක්‍යයේ කර්තෘ අනුක්ත වේ.
ii. "ළමයි පන්තියට ගොස් නැත" යන්න නිවැරදි වාක්‍යයකි.
iii. "ඔවුන් ආවොත් මම යමි" වාක්‍යයේ "ආවොත් " යන්න අසම්භාව්‍ය ක්‍රියාවකි.
iv. සුම්හිරි, යළි, වහා යන පද තුනට අව්‍ය පද වලට උදාහරණ වේ.

Learning Resource Center R De Mazenod College Kandana

- 7- 8 ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පද තෝරන්න.

07. ශ්‍රී ලාංකීය කලා කෘති වලට ඉන්දියානු ........................ ලැබී ඇති බව ඉතිහාසඥයෝ ප්‍රකාශ කරති.

i. ආභාෂය
ii. අනුකරණය
iii. හැඩය
iv. අනුවර්තනය

09. මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථය දෙන පදයක් සහිත පද පේළිය තෝරන්න.

i. නිග්‍රහ - විග්‍රහ, සංග්‍රහ, නින්දා, අවලාද
ii. පශ්චාත් - අනතුරුව, පසුතැවිල්ල, පැසසුම, නාගරික
iii. අයස - නිරාමිෂ, විධාව, විශ්‍රාමය, අනීත
iv. විරල - සරල, දුබල, විතර, පමණ

10. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

i. සඳ - හිමකර, ගහරජ, උළිඳු, නිශාචර
ii. විශාල - විසල්, තැබල, විපුල්, කුමුල
iii. සියපත - පද්ම, කමල, කුසුම්, පියුම්
iv. සිංහයා - කෙසරු, බාසුරු, මීහිඳු, සිහ

- 11 - 12 ප්‍රශ්නවල අංකිත කොටස් අයත් ව්‍යාකරණ වර්ගය තෝරන්න.

11. සුවඳයි මුවේ මල්පැණි - නෙතගින් හැළේ තිල්මිණි

i. උපසර්ග
ii. සන්ධි
iii. නිපාත
iv. කෘදන්ත

12. ඔහුගේ ප්‍රාර්ථනාව දවල් හීනයකි.

i. රූඪී පද
ii. විශේෂණ පද
iii. කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා
iv. ප්‍රාර්ථනා ක්‍රියා

- 13 - 14 ප්‍රශ්න වල මුලින් දී ඇති පදය නිවැරදිව විසන්ධි කර ඇති වරණය තෝරන්න.

13.

i. සිත්කම් - සිතු + චම්
ii. ජීවනෝපාය - ජීවන + උපාය
iii. ගිනියම් - ගිනි + අම්
iv. පත්කිරු - පත් + තිරු

14.

i. මංමුල - මන් + මුළ
ii. කම්මුල - කම් + උල
iii. බුදුකුරු - බුදු + අකුරු
iv. දණිස - දණ +හිස

15. යංශය, ගැටපිල්ල, රේඑය, ගයනුකිත්ත අනුපිළිවෙලින් යෙදී ඇති වරණය තෝරන්න.

i. ද්‍රව්‍ය, ක්‍රෑර, ප්‍රකෘති, ඖෂධ

ii. ඍණ, නෞකාව, වර්ධනය

iii. ධම්, වෘකයා, ප්‍රලේඛන, ගෘහය

iv. ශිෂ්‍යයා, අභිවෘද්ධිය, කම්ය, භෞතික

- දී ඇති ප්‍රකාශයට ගැළපෙන ප්‍රස්ථාව පිරුළ තෝරන්න.

16. ඉසුරු කරන කියන වැඩ වලින් අනාගතයේ ඔහු කෙබඳු අයෙක් වනු ඇද්දැයි දැන්ම කිව හැකිය.

i. ගහේ කුටු උල් කරන්න ඕනැයැ

ii. හැදෙන ගහ දෙපෙත්තෙන් දනේ.

iii. කහරු ගහේ සෙවණැල්ලත් සිසිල්ය,

iv. ගඟට ඉනි කැපුව වගේ

17. තමා ප්‍රයෝජනයට නොගෙන අනුන්ටත් ප්‍රයෝජන නොදිම.

i. ගොනා පිට හකුරු පටවන්න වගේ

ii. පිදුරු ගොඩේ ඉන්න බල්ලා වගේ

iii. පිරුණ කළේ දිය නොසැලේ

iv. ඇඟිල්ලේ තරමට ඉදිමිය යුතුයි

18. තමාගේ තත්ත්වයට වඩා ඉහළින් සිතීම

i. ලූලා නැති වළට කනයා පණ්ඩිතයා

ii. හැදෙන ගහ දෙපෙත්තෙන් දනේ.

iii. පිරුණ කළේ දිය නොසැලේ

iv. ඇඟිල්ලේ තරමට ඉදිමිය යුතුයි

19. කිසියම් නිර්මාණයකට වචනයෙන් පැවසෙන අර්ථයට වැඩියෙන් වැටහෙන දේ හඳුන්වන්නේ,

i. අනුප්‍රාසය | iii. ධ්වනිතාර්ථය

ii. අර්ථ රසය | iv. රූපකය

20. උක්ත පදයක් හා අනුක්ත පදයක් සහිත වරණය තෝරන්න.

i. වන සතුන්, මිනිසෙකු | iii. දේවතාවුන්, කාන්තාවක

ii. ගුරුවරු, මහල්ලෝ | iv. යක්ෂයෝ, දෙවඟනක

21. ප්‍රථම පුරුෂ , ස්ත්‍රී ලිංග උතීත කාල ඒක වචන ආඛ්‍යාතය වන්නේ,

i. යන්නිය  ii. කරන්නී  iii. කැඩුවාය  iv. සොයනුව

22. දිගාමඩුලු උප භාෂාව අනුව "පරියා" යනු

i. වලසා ය  ii. ඌරා ය  iii. මී හරකා ය  iv. අලියාය

26.07.2019
11 ශ්‍රේණිය
සිංහල භාෂාව හා සාහි.

- 23- 24 ප්‍රශ්න වල ව්‍යාකරණානුකූල නිවැරදි වාක්‍ය තෝරන්න.

23.

i. මදුරුවෝ රෝග බෝ කරති' යි වෛද්‍යවරු පවසති.

ii. ඈ මනාලියක මෙන් සැරසී සිටියාය.

iii. ඊයේ වැඩ කළ මිනිසුන් කෝ ?

iv. ළමයි එය සකස් කරාවී.

24.

i. මුහුදු බඩ වැසියෝ ධීවරයෝ වෙති.

ii. මිනිස්සු අවංක විය යුතුය.

iii. නාහිමි එතෙර වඩිති.

iv. එක් කෙනෙක් බසය පසු පස දිවූහ.

25.

i. මග යන්නන් ද අසල්වාසීහු ද මේ ගහේ අඹ කඩති.

ii. කෝට්ටේ යුගයෙන් පසු සිංහල සාහිත්‍යයත්, සිංහල රාජ්‍යයත් පිරිහී ගියෝය.

iii. එහි පැමිණී සිටි බොහෝ දෙනෙකු මා මීට පෙර දක්නා ලදී.

iv. අප සමගියෙන් වැඩ කළහොත් රට නැංවිය හැකිය.

26. පහත (අ). (ආ) කොටසේ දක්වෙන සංඛ්‍යා නාම හා සංඛ්‍යා අතරින් වඩාත් ගැළපෙන වරණය තෝරන්න.

| අ | ආ |
|---|---|
| A. පන්සාලිස් | E 18 |
| B. එකුන් සැත්තෑ | F 69 |
| C. සූසැට | G 45 |
| D. අටළොස් | H 64 |

i. CF  ii. DH  iii. AG  iv. BE

27. පසක් වන විකාශනය , සාදක ,අනුචිත යනපද සකරෙහි අර්ථය නිවැරදි ව පිළිවෙළින් දක්වන වරණය වන්නේ,

i. හැඟවෙන, අවශාන, පුද්ගලයන්, සුදුසු

ii. ඔප්නැංවෙන, ප්‍රකාශ, සතුරන්, ප්‍රමාණවත්

iii. පැහැදිලි වන, ක්‍රමයෙන් වෙනස් වීම, හේතූන්, නුසුදුසු

iv. විනාශ වන, විකෘති, මිතුරන්, කාලෝචිත

28. "අනුන්ගෙන් කා බී දවස ගෙවන්න" යන කියමනේ අර්ථය දෙන වරණය වන්නේ,

i. සුදු අලියා

ii. පිං ගොනා

iii. මසුරු සිටාණෝ

iv. පුලන්නා

- එක් එක් පේළියේ ඇතුළත් වචන හෝ යෙදුම් හැඳින්වීම සඳහා ඒ ඒ පේළියේ මුල යොදා ඇති ප්‍රකාශයට වැරදි විස්තරය ඇති පේළිය තෝරන්න.

29.

i. යුගළ පද - නඩුහබ, නිලතල, තහින දෙහින, මසිත.

ii. විශේෂණ පද - කෙට්ටු ළමයා, සෙමින් යන්න, උෂ්ණ සතුව, සැපසේ නිදියි.

iii. ප්‍රස්තාව පිරුළු - ඇඳිරි ඉගට කැවුම් දීක් කරන්න වගේ, පුහුල් හොරා කරෙන් දනේ

iv. උපමාලංකාර - උගත් තරුණයා, මහල්ලෙකි, නිල්මිණි, යුගය,දෙනුවන

~~v. බ්‍රහස්පතින්දා දින කාර්යාලයේ නිලධාරීන් නැත.~~



Learning Resource Center
R
De Mazenod College
Kandana

30. මිශ්‍ර ක්‍රියා අර්ථය දෙන පදයතෝරන්න.

i. පොත පත කියවූ ළමයා වාඩි විය.

ii. හැම දෙනාටම සුභ අනාගතයක් වේවා!

iii. වැසි වසිද්දී ගොවියෝ ගෙවල් බලා යති.

iv. වසු පැටියා මව නොදුක අඬා අඬා සිටී.

31. නිවැරදි ලෙස අකුරු යෙදී ඇති පද පමණක් දක්වෙන පේළිය තෝරන්න.

i. සංස්ථාව, පරාක්‍රමබාහු, කාර්‍යාලය, විමර්ශණය

ii. වීරොධාර, වල්ලුකුල, කෘෂිකර්මය, ඓක්‍යය

iii. ලේඛනය, ශිෂ්ටාචාරය, සම්බන්ධය, දර්ශනය

iv. සම්ප්‍රදාය, හස්ථියා, සාශනය, ඖෂධාලය

32. මෙම කවි පදය ඇතුළත් නාට්‍ය වන්නේ,

"උඹ මිනිහෙක් වෙයන් පුතේ
කුස ගිනි වෙයි එකම සතුරා
අඳුරට බිය වෙයන් පුතේ
හිරු එළියට බිය නොම ව

i. නරි බෑණා

ii. මනමේ

iii. හුණු වටය

iii. ගුරු කරුව

- ව්‍යාකරණානුකූල වචඩාක් සුදුසු වචනය තෝරන්න.

33. ශීඝ්‍රයෙන් වැඩෙන , පැතිරෙන පරිගණක විද්‍යාව නිසා අනාගත ලෝකය බලවත් විපර්යාසයකට පත්විය හැකි යැයි ...........................පවසති.

i. විචාරයක්

ii. විචාරකයෝ

iii. විචාරකයෙක්

iv. විචාරකයා

34. නාට්‍ය සංදර්ශනය අවසානයේ ..................................... තම නිවෙස් බලා පා නැගුහ.

i. ළමයි සියල්ලන්ම

ii. පුත + උත්, විය + අවුල් ලිප් + ගල, දකුණු + ඇස

iii. පස් + ඇස්, දඬු + කම්, ක්‍රියා + අධිකාරය, හබර + අල

iv. විස් + සම්, පොල් + අත්ත දෙ + අත, පත් + ඉරු

35. 'සුදු හුණු ගානවා'යන්නෙහි අර්ථය දෙන වරණය තෝරන්න.

i. ඇත්ත වසන් කරනවා.

ii. වර්ණනා කරනවා.

iii. ප්‍රශංසා කරනවා.

iv. අනුබල දෙනවා.

36. 'අඩ සඳවන් නළලත මත කුංකුම තිලකය හුදිලේ ' මෙහි ඇති උපමාව වන්නේ,

i. නළලත

ii. කුංකුම

iii. තිලකය

iv. 'අඩ සඳ

37. එකම වර්ගයට අයත් නොවන යුගල පදයක් ඇතුළත් නරණය තෝරන්න.

i. වෙහෙර විහාර, රැකීරක්ෂා, බණදහම්, දුගීදුප්පත්

ii. ඇතමැත, අගමුල, බාලමහළු, ගුණදොස්

iii. බඩුමුට්ටු, කොවිල්පවිල්, ගමනබිමන්, මුදල්හදල් .

iv. තරහමරහ, අඩුමකුඩුම, ලට්ටලොට්ට, ජරමර

පහත මුලින් දී ඇති පාඨයට වඩාත් සමීප අර්ථය සහිත වරණය තෝරන්න.

38. ලෝක ජනගහනයෙන් සියයට 70 කට පිරිසිදු ජලය ලබා ගැනීමට නොහැකි තත්ත්වයකට මුහුණ දී ඇත්තේ කාර්මීකරණය හේතු කොට ගෙන ගංගා හා විල් ජලය අපවිත්‍ර වීම අසීමිත ලෙස සිදු වන බැවිනි.

i. පිරිසිදු ජලය ලබා ගැනීමට නොහැකි වී ඇත්තේ ජනගහනය ශීඝ්‍රයෙන් වැඩි වන නිසාය.

ii. අද ලෝකයේ වැඩි දෙනෙකුට පිරිසිදු ජලය ලබා ගැනීමට නොහැකි වී ඇත්තේ කාර්මීකරණය නිසාය.

iii. කාර්මීකරණය සීමිත වුවහොත් ලෝකයාට පිරිසිදු ජලය ලබා ගැනීමට හැකි වනු ඇත.

iv. අසීමිත ලෙස ජලය අපතේ යැවීම නිසා කාර්මික රටවල ජනයාට පිරිසිදු ජලය ලබා ගැනීමටනොහැකි වී ඇත.

39. "ඉතිහාසය අප වටා පිටාවේ සෑම තැන ජීවමානය"

i. ඉතිහාසයට පරිසරය අවශ්‍යය.

ii. ඉතිහාසය ජීවමාන මිනිසුන්ගේ කතාවය.

iii. අප පරිසරයේ කොතනත් ඉතිහාසය.

iv. අපත් වටපිටාවත් බැඳෙන්නේ ඉතිහාසයෙනි.

40. පහත සඳහන් පද ඛණ්ඩය ඇතුළත් කෘතිය වන්නේ කුමක්ද?

සාර ජලය අඹ දඹ රඹ ද වල්පිට
මීර ජලය ඇළ දොළ කඳු පිටින් බට

i. සැළලිහිණි සන්දේශය

ii. හංස සන්දේශය

iii. ගිරා සන්දේශය

iv. මයුර සන්දේශය

26.07.2019

De mezenod college - kandana De mezenod college - kandana De mezenod college - kandana De mezenod
ද මැසිනොද් විදුහල - කඳාන ද මැසිනොද් විදුහල - කඳාන
De mezenod college - kandana De mezenod college - kandana De mezenod college - kandana De ද මැසිනොද්
විදුහල - කඳාන ද මැසිනොද් විදුහල - කඳාන ද මැසිනොද් විදුහල - කඳාන
mezenod college - kandana mezenod college - kandana mezenod college - kandana mezenod college

# ද මැසිනොද් විදුහල - කඳාන

# De mezenod college - kandana

| 21 | B | 11 |
|---|---|---|

## 2019

11 ශ්‍රේණිය

## දෙවන වාර පරීක්ෂණය

De mezenod college - kandana De mezenod college - kandana De mezenod college - kandana De mezenod
ද මැසිනොද් විදුහල - කඳාන ද මැසිනොද් විදුහල - කඳාන ද මැසිනොද් විදුහල - කඳාන ද මැසිනොද් විදුහල -
De mezenod college - kandana De mezenod college - kandana De mezenod college - kandana De

**සිංහල II**

**කාලය පැය 2 යි**

- **උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න**

**අංක (1), (2), (3), (4) ප්‍රශ්න වලටත් 5, 6, 7 ප්‍රශ්න වලින් එක්කකටත් පිළිතුරු සපයන්න.**

**මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 80 කි**

Learning Resource Center
R
De Mazenod College
Kandana

**I.** "දිවි හිමියෙන් මා ඒ වේදනාවෙන් පෙළෙනබව දනිමි"

(අ) මෙය කාවිසින් කාහට ප්‍රකාශ කරන ලද්දක්ද ?

..............................................................................................................

(ආ) මෙම උද්ධෘතය ඇතුළත් මුල්කෘතියේ රචකයාගේ වෙනත් මෙවැනිම නිර්මාණයක් නම් කරන්න.

..............................................................................................................

**II.** "අපි යම්හ බොහෝ කාර්යය ඇත්තම්හ"

(අ) මෙම උපුටනය ඇතුළත් නිර්මාණය කවර යුගයකදී නිර්මාණය වුවක්ද ?

..............................................................................................................

(ආ) මෙය ඇතුළත් මුල්කෘතියේ දාහතරවන පරිච්ඡේදයේ දැකිය හැකි විශේෂත්වය කුමක්ද ?

..............................................................................................................

**III.** "දිමුත් වෙහෙර වට විසිතුරු මල් වතුය
එහිත් සුවඳ මල් නිති වෙයි <u>මිණි</u> <u>මුතුය</u>."

(අ) මෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

..............................................................................................................

(ආ) ඉරි ඇඳි පදයේ අර්ථය දක්වන්න.

..............................................................................................................

**IV.** පහතින් දැක්වෙන නිර්මාණ කවරුන් විසින් රචනා කරන ලද්දේදැයි දක්වන්න.

- නන්දන ගීතය ..............................................
- සැවේජ් සැන්චුවරි — savage sanctuary ..............................................
- සුදුගෝනා ..............................................
- කවි ලකුණු මිණිමල ..............................................

සුපුල් මල්යහන් ලිය මඬුලිය ගෙ පෙළ

එකල් කෙළත වන දෙව්ලිය දැකැ කොමළ

ලසල් රූකක සැකපෙව ලුපලු සිහිලළ

(අ) මෙම පද්‍ය නිර්මාණය ඇතුළත් මුල්කෘතියේ ආරම්භක කවිය කවර වරිනකින් නිර්මාණය වූවක්ද ?

......................................................................................................................................

(ආ) ඉරි ඇඳි පද දෙකේ අර්ථය ලියා දක්වන්න.

......................................................................................................................................

VI. යමෙමක් ඊ දණ්ඩක් බැඳ විද , පි පතක් දුටුයේ වී නම් වහා ගෙනවුත් මට දෙව"

(අ) මෙලෙස විධාන කරන්නේ කව්රුන්ද ?

......................................................................................................................................

(ආ) මෙම උපුටනය ඇතුළත් මුල්කෘතිය රචනා කිරීමට පදනම් වූ කෘතිය කුමක්ද ?

......................................................................................................................................

VII. (අ) මෙරට ජන කවියට අනුරාධපුර යුගය දක්වා දීර්ඝ ඉතිහාසයක් පවතින බවට සාක්ෂි ඇතුළත් කෘතිය කුමක්ද ?

......................................................................................................................................

(ආ) සිංහල සාහිත්‍ය වංශ කතාවේ පැරණිම සංදේශ කාව්‍ය වන්නේ කුමක් දැයි දක්වා එය කවර යුගයකදී රචනා වී දැයි දක්වන්න.

......................................................................................................................................

VIII. සියපින් සිරින් සරු

දෙතිස් ලකුණෙන් විසිතුරු

කෙලෙසුන් කෙරෙන් දුරු

විදිමි මුනි උතුමන් තිලෝගුරු

(අ) මෙම පද්‍ය නිර්මාණයේ ලඝු අක්ෂර දෙකක් හා ගුරු අක්ෂරයකින් යුක්තව කාව්‍ය ආරම්භ කළ ගණය නම් කරන්න.

......................................................................................................................................

(ආ) මෙම නිර්මාණය ඇතුළත් කෘතිය රචනා කිරීමට ආරාධනා කළ අයගේ නම කුමක්ද ?

......................................................................................................................................

IX. බලව් පොළොන්නරු අනුරාපුර පෙදෙස

සිතව් පැවති නිදහස මෙහි පෙර දවස"

(අ) මෙම නිර්මාණය කළ රචකයා අතින් බිහිවූ ජාතික වීර කාව්‍ය නම් කරන්න.

......................................................................................................................................

(ආ) ඉහත නිර්මාණය එම රචකයාගේ කවර නිර්මාණ විශේෂයකට අයත් වී දැයි දක්වන්න.

......................................................................................................................................

X. "පාලි ක්‍රමය හැර අර්ථය පමණක් ගෙන අප කළා වූ ප්‍රබන්ධයෙහි ක්‍රම විලසෙනාදි වූ අඩු වැඩි ඇතත් එය නොසලකා...."

(අ) මෙය කව්රුන් විසින් කරන ලද ප්‍රකාශයක්ද ?

......................................................................................................................................

(ආ) මෙයින් කියැවෙන නිර්මාණයේ නිර්මාණ නාමයෙන් කියැවෙන අර්ථය කුමක්ද ?

..............................................................................................................................

I. සෘධිමය පා සිවුරු ශරීරයේ ප්‍රතිමුක්ත වී යැ.හෙ මැ ඔ හට පැවිජි වී යැ. හෙ මැ උපසපන්කම් වී යැ.

(අ) ඉරි ඇඳි පද දෙකේ අර්ථය ලියා දක්වන්න.

..............................................................................................................................

(ආ) මෙවැනි ආශ්චර්යයක් සිදුවීමට බලපෑ කරුණ පැහැදිලි කරන්න.

..............................................................................................................................

II. නොයෙක් තැනම පිපි මල් පිරුණු පොකුණුය.

ගෙයක්කනම සැදැහත් දෙවනා දකුණුය.

සුදක් ලෙස තිබෙයි මළු මං හැර කුණුය.

සියක් අය කෙරෙති වැඳ පුද පැදකුණු ය.

(අ) ඉරි ඇඳි කවිලැකියෙන් කියැවෙන පදවල ලෙව්ලැකිපද ඉදිරිපත් කරන්න.

..............................................................................................................................

(ආ) මෙම ප්‍රදේශවාසින් සතුව පැවති ලක්ෂණ දෙකක් ඉදිරිපත් කරන්න.

..............................................................................................................................

III. සේ රිවි බිම්බා පතළ තෙද බලැති මහරු

මෙන රන් වැම්බා නිසසල ගුණයෙන් සපිරූ

(අ) මෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

..............................................................................................................................

(ආ) මෙම උපුටනයේ දක්නට ලැබෙන උපමා දෙකක් උපමා උපමේය ලෙස බෙදා දක්වන්න.

..............................................................................................................................

IV. [illegible]න්ධවයන් යොදන ලද සර්වාලංකාරයෙන් සැරැහී පිටැ බඳිනා ලද හියොවුරු ඇති වැ නැගෙන ලද ධනුර්ධරයන් විසින් උපලක්ෂිත වූ සේනා නැමති සමුද්‍රයෙන් නැංගා වූ මහ තල්මස් කැලක් සේ...

(අ) මෙලෙස විස්තර කරන්නේ කවර සේනාවක් පිළිබඳව ද ?

..............................................................................................................................

(ආ) මෙම උද්ධෘතයේ අදහස ඔබේ වචනයෙන් ඉදිරිපත් කරන්න.

..............................................................................................................................

V. "නිදහස මහ මුහුදක් වේ

එහි උල්පත පුත තුඹ වේ

ඒ බව සිහි කොට මෙලොවේ

යුතුකම ඉටු කළ යුතු වේ."

(අ) මෙහි දක්නට ලැබෙන රූපක අලංකාර 02ක් දක්වන්න.

..............................................................................................................................

(ආ) රූපක අලංකාර දෙකින් මතුකරන අදහස ඔබේ වචනයෙන් ඉදිරිපත් කරන්න.

..............................................................................................................................

**03.** (අ)

i. බැද්දේගම වෙසෙන වියපත් ගැහැණු මිනිසුන්ගේ ඉරණම කවර ආකාරදැයි දැක්වීමට රචකයා භාෂාව යොදාගත් ආකාරය කර්ලිනා හාමිගේ චරිතය ඇසුරින්ද,

ii. බැද්දේගම යනු විනාශ වී ගෙන යන කැළෑ ගම්මානයක් බව හැඟවීමට භාෂාව උපයුක්ත කොටගත් ආකාරය ආරච්චිගේ ගෙය කැලයට යටවන සැටියෙන්ද

දැක්වීමට රචකයා ගත් උත්සාහය සාර්ථක වීදැයි එක් කොටසකට නිදසුන් දෙක බැගින් දෙමින් විමසන්න.

**නැතහොත්**

(ආ)

i. විවාහ ජීවිතයේ ගැටළු ප්‍රශ්න මතුවීමටත්

ii. ප්‍රශ්න සමනය කර ජීවිතය සාර්ථක කරගැනීමටත්

යන කරුණු ද්විත්වයටම වගකිව යුතුවන්නේ තම තමන්ගේ ක්‍රියා කලාපයමය. උග්ගසේන සිටුපුත්‍රයාගේ කතාවස්තුව ඇසුරින් උක්ත ප්‍රකාශය සනාථ කරන්න.

**04.** (අ)

i. කුඩලිගමයන්ගේ ගංගාවේ සංගීතය නිර්මානය විෂයෙහි බලපෑ බෞද්ධ සංකල්ප මෙන්ම ටාගෝර් තුමාගේ නිර්මාණ සංකල්පත්

ii. එම සංකල්ප පෝෂනයෙහි ලා භාවිතා කරන ලද කථන ක්‍රමයේ උචිතානුචිත භාවයත් එක් කොටසකට නිදසුන් දෙක බැගින් දෙමින් විමසන්න.

**නැතහොත්**

(ආ)

i. ස්වභාවික පරිසර අත්දැකීමක් තුලින් මතුකරන ගැඹුරු වූ ජීවන දර්ශනයත්

ii. කථකයා විදි අත්දැකීම , හැඟීම සහෘද මනසෙහිත් ඇතිකිරීම සඳහා භාවිතා කළ ජන සාහිත්‍යයික බසක් නිර්මාණය සාර්ථක වීමෙහිලා බලපෑ ආකාරය වස්සානය පද්‍ය නිර්මාණය ඇසුරින් විමසන්න.

**05.** සංගීත රසය සියලුම සත්ව වර්ගයා විෂයෙහි පොදුවූවක් බව ගුත්තිල කාව්‍ය නිර්මාණයෙන් පෙනියයි. උ[illegible]ය නිදසුන් තුනක් ඇසුරින් විමසන්න.

**06.** ජන කවියා සතු සංක්ෂිප්ත භාවයත්, අව්‍යාජ භාවයත්, ධ්වනිතාර්ථ භාවිතයත් කුරහන් ඉසිමුව කළුවර බලාලා පාඩම ඇසුරින් අගයන්න.

**07.** සැලළිහිණි සන්දේශයෙන් හෙලිවන කෝට්ටේ යුගයේ සමාජීය හා සේ ඓතිහාසික තොරතුරු නිදසුන් තුනක් ඇසුරින් විමසන්න.

26.07.2019

De mezenod college - kandana De mezenod college - kandana De mezenod college - kandana De mezenod
ද මැසිනොද් විදුහල කඳාන

# ද මැසිනොද් විදුහල - කඳාන

21 | B | L

විදුහල කඳාන - De mezenod college - kandana De mezenod college - kandana De

## De mezenod college - kandana

kandana De ද මැසිනොද් විදුහල කඳාන - ද මැසිනොද් විදුහල කඳාන -
ද මැසිනොද්

## දෙවන වාර පරීක්ෂණය

11 ශ්‍රේණිය

De mezenod college - kandana De mezenod college - kandana De mezenod college - kandana De me
කඳාන ද මැසිනොද් විදුහල කඳාන - ද මැසි

සිංහල භාෂාව හා සාහිත්‍ය III

කාලය
පැය 2 යි

නම - පන්ති අංකය -

(i) සිට (X) තෙක් ඇති සියලු ම අනු කොටස්වලට කෙටි පිළිතුරු ලියන්න.කිසියම් අනු කොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම් ඔබ අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. (අ) අකාරාදියට සකස් කල විට මැදට යෙදෙන පදය කුමක්ද ?

ක්ෂුධාවෙන් , ඖෂධවේදී , ඥානෝපදේශය , ජෞතිෂිත , සංශයාර්ථ ...........................

(ආ) සංයුක්ත ස්වරාක්ෂර නම් කරන්න...........................

ii. පහත දැක්වෙන පදවල ස්වර හා ව්‍යඤ්ජන වෙන්කර දක්වන්න.

(අ)

- වාංපතුල් ...........................
- අළුගෝසුවා ...........................

(ආ) දන්තෝෂ්ඨජ අක්ෂර දෙකක් නම් කරන්න...........................

iii. පහත දැක්වෙන පද සන්ධි කර සන්ධි නාමය දක්වන්න.

(අ) මුගු + බියලි ...........................

(ආ) මහී + අංගනය ...........................

iv. අමරස වන් අඹ රස <u>බුදිමින්</u> සිනිඳු
<u>නිති</u> ගෙ උයන් පෙදෙසෙහි සරමින් පසිඳු

(අ) ඉරි ඇඳි පද කවර ව්‍යාකරණ ගණයට අයත් දැයි දක්වන්න.

...........................

...........................

(ආ) ප්‍රකෘති හා ප්‍රත්‍ය වෙන්කර දක්වන්න.

- ආර්ථික ...........................
- ශිෂ්‍යත්ව ...........................

Learning Resource Center
R
De Mazenod College
Kandana

v. පහත දැක්වෙන උඩරට උප භාෂා වන්හි අර්ථය දක්වන්න.

(අ)

- පහිනය ........................................................................................
- පුන්නනවා ........................................................................................

(ආ) උපසර්ග වෙන්කොට දක්වන්න.

- අමුදිත ........................................................................................
- ප්‍රතිපත්තිගරුක ........................................................................................

vi. පහත වාක්‍යවල සදොස්තැන් නිදොස්කොට දක්වන්න.

(අ) තරුණ තරුණියෝ ක්‍රීඩා උත්සවයට පැමිණෙතියි සන්විධායකයන් සිතයි.

........................................................................................

(ආ) ශිෂ්‍යයෝ කැටුව ගුරුවරුන් උත්සව ශාලාවට පැමිනෙති.

........................................................................................

vii. කර්මකාරකයට හරවන්න.

(අ) මුළු රටම පිළිගත් වියතෙක් ශිෂ්‍යයන් අමතා කතාවක් පැවැත්විය.

........................................................................................

(ආ) පලබරින් නැමුණු වෘක්ෂයෝ පක්ෂීන් සතුටට පත් කළහ.

........................................................................................

viii. පහත දැක්වෙන වැකියේ අක්ෂර වින්‍යාසයේ සදොස්තැන් ඇතොත් එම පද නිදොස්කොට දක්වන්න.

රක්ෂණ සමාගමේ අධ්‍යක්ෂ වරයා පිළිබඳව විමර්ෂණ සෙබලමුලු ඉදිරියේ පැවැත්විණි.

(අ) ........................................ (ආ) ........................................

ix. පහත දැක්වෙන පද කවර සමාස වර්ගයකට අයත්දැයි දක්වන්න.

(අ) වැලිතලප ........................................................................................

(ආ) ප්‍රබල ........................................................................................

x. "මලු" , " මළු" යන පද දෙක අර්ථය පැහැදිලි වන ලෙස වාක්‍යවල යොදන්න.

(අ)........................................................................................

(ආ)........................................................................................

( ලකුණු 2 × 10 = 20 )

2) පහත සඳහන් අ, ආ, ඉ, ඊ විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) ලෝක ජල පරිමාවෙන් 97% ක් කරදිය වන අතර 3% ක් මිරිදිය වේ. ලෝක ජනතාවගේ පරිහරණයට මෙම ජල ප්‍රමාණය කොසේවත් ප්‍රමාණවත් නොවේ. එමෙන්ම වර්තමාන කාලයෙහි පවතින දේශගුණික විපර්යාසයන් මෙන් ම ජල මූලාශ්‍ර සිඳී යාම ද විශාල තර්ජනයක් වී තිබේ. මේ නිසා අනාගතයේ දී පිරිසිදු ජලය ලබා ගැනීමට විශාල මුදලක් ආයෝජනය කර ජල සිරිපහදු සේවාවන් පවත්වා ගෙන යාමට සිදුවනු ඇත. සීමිත ජල සම්පත නිසි කළමණාකරණයකින් යුතුව පරිහරණය කරන්නේ නම් ජල හිඟයට යම් විසඳුමක් ලබා ගත හැකිය.

(ආ) මනා පෞරුෂයකින් හෙබි පුද්ගලයෙකු සමාජයට දායාද කිරීමට බලපාන ප්‍රමුඛ පෙළේ සාධකයක් ලෙෂ ක්‍රීඩාව හඳුන්වා දිය හැකිය. එමෙන්ම ක්‍රීඩාව මිනිසාගේ මානසික හා කායික අභිවෘධියෙහි වර්ධනයක් ඇති කළ හැකි අංගයකි. එයින් ලැබෙන විනෝදය ද අතිමහත්ය. ක්‍රීඩාලෝලීන් අතර ගොඩනැගෙන සමගිය හා එකමුතුකම සමාජ ප්‍රගමනයට ද හේතු වේ. ලෝක වාසී සියලු දෙනාම පාහේ එක ක්‍රීඩාවක් හෝ ප්‍රගුණ කිරීම අත්‍යවශ්‍ය කරුණක් වේ.

(ඉ) අප ජීවත් වන්නේ බහුවාර්ගික රටකය ඒ හෙයින් විවිධ ආගම් අදහන විවිධ සංස්කෘතික තත්වයන් හමුවේ සහජීවනයෙන් යුතුව කටයුතු කිරීමට අපට සිදුවනු ඇත. ගද්‍ය පද්‍ය මෙන්ම දෘශ්‍ය සාහිත්‍ය නිර්මාණ එකලෙස රස විඳීමෙන් සංවේදී මිනිසුන් බිහිකරනවා සේම විවිධ සංස්කෘතික පරිසරයෙන්ම ආදරය කරන ගරුකරන ජානතාවක් බිහිකිරීමට සමත් වෙයි. සංහිඳියාව කෙරෙහි ඉන් මහගු බල පෑමක් කළ හැකි බවද නොරහසකි ඒ පිළිබඳ සිතීමට කාලය එළඹ ඇත.

(ඊ) රූපවාහිනී මාධ්‍ය ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යක් ලෙස සෙසු මාධ්‍ය අභිබවා ජනතාව අතර වඩා ප්‍රචලිතව ඇත. නමුත් ළමයින් වෙනුවෙන් ඉදිරිපත් කෙරෙන වැඩසටහන් හී ගුණාත්මක බවේ අඩු ලුහුඩුකම් දක්නට ලැබෙයි. කාලීන අවශ්‍යතා ගැටළු හඳුනාගෙන වැඩසටහන් නිර්මාණය කළ යුතුව ඇත. එනම් දේශීයත්වය අගයන සංකල්ප ,සහජීවනය සමානාත්මතාවයේ අගය මනුෂත්වය ඇගයීම ආදී ආකල්පමය වෙනස්කම ඇතිකරන වැඩසටහන් හී අවශ්‍යතාවයයි.

3) පහත දැක්වෙන පාඨය වචන 55 - 65 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

ජනශ්‍රැති යනුවෙන් අප විසින් හඳුන්වනු ලබන ජන සම්ප්‍රදායයන් සියල්ල තුළින් මූලිකව ම සිදු කරනු ලැබ ඇත්තේ එක් පරම්පරාවක් විසින් ලබා ගන්නා ලද සමස්ත දැනුම් පද්ධතිය ඊළඟ පරම්පරාව සඳහා උරුම කොට දීමය. මේ දැනුම් සම්භාරය යනු එක අංශයකට එක පැතිකඩක් පමණක් සම්බන්ධ වූ ඒවා නොවිය. එහෙයින් කුමන ජනශ්‍රැතියක් විශ්ලේෂණයට භාජනය කරනු ලැබුවත් , යම් අංශයක් හා බැඳී දැනුම් ඒ වටා ගොනු වී ඇති බව දැකිය හැකි වනු ඇත. මින්නේරිය වැව වේවා , කලා වැව වේවා , සොර බොර වැව වේවා ආශ්‍රය කොට ගත් ජනප්‍රවාද සලකා බැලූ කල්හි ඒවායෙහි විනිවිද දැකිය හැක්කේ පැරැන්නන් වැව් බැඳීම සඳහා යෝග්‍ය ස්ථාන නිශ්චිත කොට ගැනීමට පාදක කොට ගත් කරුණු ය. වැව් බැඳීම සඳහා යොදා ගත් තාක්ෂණික ක්‍රමවේදයන් ය. අනුගමනය කළ සිරිත් විරිත් ය. ඉටු කරන ලද පූද පිළිවෙත් ය. අනුරාධපුර වේවා .දඹදෙනිය වේවා, පොළොන්නරුව වේවා අගනුවර ඇසුරු කොට ගත් ජනප්‍රවාද මගින් අපට ආරක්ෂා සහිත ජයග්‍රාහී රාජකීය අගනුවරක් ඉදි කිරීම සඳහා යෝග්‍ය තැන් සොයා ගැනීමට යොදා ගත් දැනුම් සම්භාරය මෙන් ම එම නගර ඉදි කිරීම සඳහා කරන ලද සැලසුම් හා උපයෝගී කොට ගත් ක්‍රමවේද පිළිබඳ අවබෝධයක් ද ලද හැකිය.

4) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු ලියන්න.

හේතුඵල වශයෙන් අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් පෙන්නුම් කරන සිදුවීම් සමුදායක් කතා ප්‍රවෘත්තිය ලෙස අදහස් කෙරේ. මුල මැද අග අංගක්‍රමයෙන් යුක්ත වූ සම්බන්ධතාවක් කතා පුවතක වෙයි. ඊ.එම්. ෆෝස්ටර් " නව කතාවක මූලික ලක්ෂණය කතාන්තරයක් ඉදිරිපත් කිරීම " බව පවසයි. නව කතාවට හිමි මේ ලක්ෂණය එහි ප්‍රභේදයක් වන කෙටි කතාවට ද පොදු ය.

කතා පුවතක සාර්ථකත්වය සඳහා අවශ්‍ය මූලික ලක්ෂණ දෙකකි. එනම් අපූර්වත්වය සහ විශ්වසනීය භාවය වේ. කතා පුවතෙහි ඓක්‍යය හා බැඳී සිද්ධි සංඝටනය මගින් සහෘද සන්තානයෙහි ඇති කරවන චමත්කාරය , අපූර්වත්වය වේ. සාමාන්‍යයෙන් අප ජීවත් වන ලෝකයෙහි "යමක් සිදුවීමට හැකිය. යන හැඟීම අප තුළ ඇති වේ නම් එය විශ්වසනීය භාවය වේ. ඉහත දක්වන ලද අනෙක් හැම අංගයක්ම විශ්වසනීය භාවය කෙරෙහි බලපෑමක් ඇති කරයි.

1. කතා ප්‍රවෘත්තිය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
2. නවකතාවක මූලික ලක්ෂණය කතාන්තරයක් බව ප්‍රකාශ කළේ කවුරුන් ද?
3. කතා පුවතක සාර්ථකත්වය සඳහා අවශ්‍ය මූලික ලක්ෂණ මොනවාද?
4. ඡේදයෙහි දැක්වෙන ආකාරයට විශ්වසනීය භාවය යනු කුමක්ද?
5. මෙම ඡේදයෙහි මුඛ්‍යාර්ථය ඔබට හැඟෙන අයුරින් ලියන්න.

5) ඔබ පරිගණක ආයතනයක් කළමණාකරු යැයි සිතා පහසු ගෙවීමේ ක්‍රමයට පරිගණක ලබා දීම පිළිබඳ පුවත්පතක් සඳහා වෙළඳ දැන්වීමක් සකස් කරන්න.

- හොඳම තත්ත්වයේ පරිගණක ආනයනය කරන ලද්දේ ජපානයෙනි.
- මුදල් ගෙවා ලබා ගන්නේ නම් 15% ක් වට්ටම් හිමි වේ.
- සාකච්ඡා කිරීමෙන් අනතුරුව පහසු ගෙවීමේ ක්‍රමයට ද පරිගණක ලබා ගත හැකිය.
- වසරක වගකීමෙන් ද යුතු වේ.
- පරිගණක ආයතනයේ නම සහ පිහිටි ස්ථානය ඔබේ අභිමතය පරිදි සකස් කර ගන්න.

නැතහොත්

කුරුණෑගල නගරයට බොහෝ දුරින් පිහිටි දංගොල්ලාගම ගමට වසර දෙකක් පමණ වැසි ලැබී නැත. වැව ද සිඳී ගොස් ඇත. සතුන් මෙන්ම ජනතාව ද බොහෝ පීඩාවට පත්ව සිටිති. බීමට දිය බිඳක් සොයා ගැනීමට සැතපුම් ගණනාක් ඈතට යාමට ඔවුන්ට සිදු වී තිබේ. ජනතාව මෙම ඛේදවාචකයෙන් බේරා ගැනීම සඳහා නළ ළිං කීපයක් සකස් කර දෙන මෙන් ඉල්ලා ප්‍රාදේශීය සභාවේ සභාපති වීරසිංහ දොළකුඹුර වෙත යවන ලිපිය සකස් කරන්න. ඔබ එම ගමේ ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් යැයි සිතන්න.